දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය - පේරාදෙණිය විශ්වවිද්‍යාලය
தொடர் தொலைக் கல்வி நிலையம் - பேராதனைப் பல்கலைக்கழகம்
CENTRE FOR DISTANCE & CONTINUING EDUCATION – UNIVERSITY OF PERADENIYA

# Bachelor of Arts (External-New Syllabus) Examination 100 Level - 2025

## ECNE 101: ආර්ථික විද්‍යාව හැඳින්වීම

**උපදෙස්:**

- ඕනෑම ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න
- කාලයඃ පැය (03) තුනක් පමණයි
- ලකුණුඃ එක් ප්‍රශ්නයකට ලකුණු 20 බැගින්

---

1. i. උපයෝගිතා න්‍යාය සහ ඉල්ලුම් න්‍යාය අතර සම්බන්ධතාවය පැහැදිලි කරන්න. (ලකුණු 06)

   ii. 'පාරිභෝගික සමතුලිතය' යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද? (ලකුණු 06)

   iii. එක් භාණ්ඩයක වෙළඳපල මිල ඉහලයයි නම් නව පාරිභෝගික සමතුලිත මට්ටමක් ඇතිවීම සඳහා කුමන හැඩගැසීම් බලපැවැත්විය යුතුද? (ලකුණු 08)

2. i. තරගකාරී කර්මාන්තයක ඉල්ලුම් සහ සැපයුම් සමීකරණ පහත දැක්වේ.

   ඉල්ලුම් ප්‍රමාණය: $P = 30 - \frac{1}{3}Q_d$

   සැපයුම් ප්‍රමාණය: $P = 6 + \frac{1}{3}Q_s$

   a. කර්මාන්තයේ සමතුලිත මිල (P) හා ප්‍රමාණය (Q) ගණනය කරන්න. (ලකුණු 04)

   b. සමතුලිතයේදී ඉල්ලුම් සහ සැපයුම් නම්‍යතාව ගණනය කරන්න. (ලකුණු 04)

   ii. "රාජ්‍ය බදු අයභාරයෙහි ප්‍රමාණය තීරණය වනුයේ භාණ්ඩයක මිල ඉල්ලුම් හා සැපයුම් නම්‍යතාව මතයි."

   a. රාජ්‍ය බදු අයභාරය තීරණයවීම සඳහා සැපයුම් මිල නම්‍යතාව බලපාන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 06)

   b. රාජ්‍ය බදු අයභාරය තීරණයවීම සඳහා මිල ඉල්ලුම් නම්‍යතාව බලපාන ආකාරය පැහැදිලි කරන්න (ලකුණු 06)

3. i. නිෂ්පාදන ශ්‍රිතය යන්නෙහි අදහස කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04)

   ii. කෙටිකාලීන සහ දිගුකාලීන නිෂ්පාදන ශ්‍රිතය අතර වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 04)

   iii. පහත දැක්වෙන නිෂ්පාදන ශ්‍රිතය සලකන්න. එහි Q මගින් නිෂ්පාදන ප්‍රමාණයද, K සහ L මගින් පිළිවෙලින් භාවිතා කරනු ලබන ප්‍රාග්ධන ප්‍රමාණය හා ශ්‍රම ප්‍රමාණයද දක්වයි. (ලකුණු 06)

   $$Q = 2K^{1/3}L^{1/3}$$

   ප්‍රාග්ධනය ඒකක 125 ක් ලෙස ස්ථාවර යැයි උපකල්පනය කරමින් ශ්‍රමයේ ආන්තික ඵලදායිතා ශ්‍රිතය ($MP_L$) ව්‍යුත්පන්න කරන්න.

   iv. ප්‍රාග්ධනය හා ශ්‍රමය 25% කින් වැඩිවේ යැයි උපකල්පනය කරන්න. එහිදී නිමැවුමට කුමක් සිදුවේද ? එසේ වීමට හේතු මොනවාද? (ලකුණු 06)

4. i. "වෙළෙඳපොල අසමත්වීම" යන්නෙන් ඔබ අදහස් කරන්නේ කුමක්ද? වෙළෙඳපොල අසමත්වීම සඳහා ප්‍රධාන හේතු මොනවාද? (ලකුණු 10)

   ii. වෙළෙඳපොල ආර්ථිකයක රජයේ කාර්යභාරය පැහැදිලි කරන්න. (ලකුණු 10)

5. පහත තොරතුරු දැක්වෙන ආර්ථිකය සලකන්න. (සියළු වටිනාකම් රු. මිලියන වලිනි).

| | |
|---|---|
| පරිභෝජනය | $C = 180 + 0.8 Y^d$ ($Y^d$ වැය කලහැකි ආදායම) |
| පෞද්ගලික ආයෝජන | $\bar{I} = 300$ |
| රජයේ වියදම | $\bar{G} = 400$ |
| බදු ආදායම | $T = 100 + 0.25Y$ |
| ශුද්ධ අපනයන | $(X-M) = 200$ |

i. මෙම ආර්ථිකයේ සමතුලිත ජාතික ආදායම (Y), සහ පරිභෝජනය (C) ගණනය කරන්න. (ලකුණු 04)
ii. ආදායම් ගුණකයෙහි අගය ගණනය කරන්න. (ලකුණු 04)
iii. පෞද්ගලික ආයෝජන වියදම් රු. මිලියන 200 කින් අඩු වූයේ යැයි සිතන්න. නව සමතුලිතය ගණනය කරන්න. (ලකුණු 04)
iv. නව සමතුලිතයන්හිදී රාජ්‍ය අයවැය ශේෂය (budget balance) ගණනය කරන්න. (ලකුණු 04)
v. ස්වාධීන වියදම් සහ පෙළඹවුණු වියදම් අතර වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 04)

6. i. ප්‍රධාන සාර්ව ආර්ථික අරමුණු මොනවාද? (ලකුණු 04)
ii. ජීවන තත්වය මැනීමෙහිලා ඒක පුද්ගල මූර්ත ද.ජා.නි. හොඳ මිණුමක් නොවන්නේ ඇයිද යන්න හේතු පහක් පැහැදිලි කරන්න. (ලකුණු 05)
iii. උද්ධමනය හා සම්බන්ධයෙන් පහත දැක්වෙන ඒවා පැහැදිලි කරන්න.
   a. මිල ප්‍රතිවිපාකය
   b. ආදායම් ප්‍රතිවිපාකය (කොටසකට ලකුණු 02 බැගින්)
iv. පහත දැක්වෙන සංකල්ප අතර වෙනස පිළිබඳව කෙටියෙන් පැහැදිලි කරන්න.
   a. මූර්ත ද.ජා.නි. සහ නාමික ද.ජා.නි.
   b. පෞද්ගලික ආදායම සහ වැයකල හැකි ආදායම (කොටසකට ලකුණු 02 බැගින්)

v. මූල්‍ය පදනමෙහි (Monetary Base) සංරචක පැහැදිලි කරන්න. මූල්‍ය පදනම තීරණයවීමට බලපාන සාධක මොනවාද? (ලකුණු 03)

7. පහත ඕනෑම මාතෘකා **හතරක්** පිළිබඳව කෙටියෙන් පැහැදිලි කරන්න.

i. ආදායම්-පරිභෝජන වක්‍රය
ii. හීනවන ආන්තික ඵල න්‍යායය
iii. පරිමාණානුකූල ඵල පිළිබඳ නියමය
iv. මුදල් සඳහා ඉල්ලුම පිළිබඳ කේන්සියානු න්‍යායය
v. උද්ධමනාත්මක සහ අවධමනාත්මක පරතරය
vi. රජය විසින් පනවනු ලබන උපරිම මිල සහ අවම මිලයන්හි අරමුණු

(කොටසකට ලකුණු 05 බැගින්)

********************************